## ඔබගේ ව්‍යාපාරයට ප්‍රජාවන් වැදගත් වන්නේ ඇයි?



රැකියා නිර්මාණය කිරීම සහ රැකියා අවස්ථා වර්ධනය කිරීම මගින් සංචාරක කර්මාන්තය ප්‍රජාවන්ට ප්‍රතිලාභ සලසයි. ප්‍රදේශය අවට පිරිස් සේවයට බඳවා ගැනීම මගින් නවාතැන් සහ ප්‍රවාහන වියදම් ඉතිරිකර ගැනීමට ව්‍යාපාරවලට හැකි වේ.



ප්‍රදේශය අවට ප්‍රජාවන් සමග කටයුතු කිරීමෙන්, සංචාරකයින් හට අමරණීය මතකයක් ඉතිරිකර දෙන උසස් සහ සැබෑ ශ්‍රී ලාංකේය අත්දැකීමක් ලබා දීමට ව්‍යාපාරවලට හැකි වේ.



ශක්තිමත් ප්‍රජා සබඳතා ගොඩනැගීම සහ ප්‍රදේශ වාසීන්ගේ විශ්වාසය දිනා ගැනීමෙන්, ගැටුම් වළක්වා ගැනීමටත්, තිරසාරත්වය වෙනුවෙන් ඒකාබද්ධ පදනමක් ගොඩනගා ගැනීමටත් අවස්ථාව උදා වේ.



ප්‍රදේශයේ ව්‍යාපාර තම අවට ප්‍රජාව සමග අත්වැල් බැඳ ගැනීමෙන්, බාහිරින් එන අනපේක්ෂිත අභියෝග සහ බාධකවලට නොසැලී මුහුණ දීමට සහ ඒවායින් යළි නැගී සිටීමට ව්‍යාපාරවලට ඇති හැකියාව වර්ධනය කරයි. උදාහරණයක් ලෙස, ප්‍රදේශය අවටින් ඔබගේ භාණ්ඩ සහ ශ්‍රමය සපයා ගැනීමෙන් ඉන්ධන ගැටලු, ආනයන සීමා සහ වෙනත් අගහිඟකම්වලින් සැපයුම් දාමයට ඇතිකරන බලපෑම අවමකර ගත හැකිය.

## ප්‍රජාවන්ට සහයෝගය ලබාදීම සඳහා ගත හැකි වෙනත් ක්‍රියාමාර්ග

- ළමුන් ආරක්ෂා කිරීම සහ මිනිස් ජාවාරම් පිළිබඳ ඔබගේ කණ්ඩායමට පුහුණුව ලබා දෙන්න.
- ප්‍රදේශය අවට ප්‍රජාවගේ යටිතල පහසුකම්, අධ්‍යාපනය සහ වෙනත් ප්‍රතිලාභ වෙනුවෙන් ආයෝජනය කරන්න/දායක වන්න.
- ප්‍රජාව තුළ, කුඩා පරිමාණ ව්‍යාපාර සහ වෙළෙඳුන් හට සංචාරකයින් සමග ගනුදෙනු කිරීම සහ තම නිෂ්පාදන අලෙවිකරණය කිරීම පිළිබඳ පුහුණුව ලබා දෙන්න.

**ප්‍රජා සම්බන්ධක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම විවිධාකාරයෙන් ප්‍රතිලාභ අත්කර දෙයි. එක් ආකාරයක් නම් කීර්තිනාමයයි. National Geographic සඟරාව පවසන්නේ, "සංචාරකයින් හට ධනාත්මක වෙනසක් ඇති කිරීමට අවශ්‍ය බැවින් ප්‍රජා සංචාරක කර්මාන්තය වඩාත් පුළුල් භූමිකාවක් ඉටුකරනු ඇත," යනුවෙනි.**

### වැඩිදුර කියවීම්

ඔබගේ ව්‍යාපාරයට ගැලපෙන ප්‍රජා සම්බන්ධක අදහස් 20 ක්

වගකීම් සහගත සංචාරක කර්මාන්තය, ප්‍රදේශය අවට ප්‍රජාවට ප්‍රතිලාභ සලසන ආකාර 8 ක්


**ඔබ නොවේ නම්, කවුද? අදම 👉 ක්‍රියා කරන්න 🌳 තිරසාර ලෙස සිතන්න 🌎**


USAID Indo-Pacific Opportunity Project (IPOP)
International Development Group LLC

56/6A Horton Place
Colombo 7, Sri Lanka
Tel: 94-112697052


USAID
FROM THE AMERICAN PEOPLE

# ප්‍රජාවන්ට සහයෝගය ලබාදීමට ඔබට කළ හැකි දේ



USAID
FROM THE AMERICAN PEOPLE

# ප්‍රජාවන්ට සහය වීමට ඔබට කළ හැකි දේ

1. ඔබේ ප්‍රාදේශීය ප්‍රජාවෙන් ලබාගත් දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් සාදාගත් ආහාර වලින් යුතු කෑම ලැයිස්තු (menu) සකස් කරන්න

2. දේශීය ප්‍රජාවට සහ සංස්කෘතියට ගරු කරමින් වගකීමෙන් සංචාරය කරන්නේ කෙසේද යන්න පිළිබඳ තොරතුරු ඔබේ අමුත්තන්ට ලබා දෙන්න

3. ගොඩනැගිලි සහ අභ්‍යන්තර නිර්මාණ සැලසුම් සඳහා දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරමින් දේශීය සංස්කෘතියේ අද්විතීය අංගයන් ප්‍රදර්ශනය සහ ප්‍රවර්ධනය කිරීමට උනන්දු වන්න

4. ඔබේ වටපිටාව තුළ ඇති සියලුම සංචාරක අත්දැකීම් ප්‍රථමයෙන්ම ඔබ විසින් අත්විඳින්න. එවිට ඔබට විශ්වාසයෙන් යුතුව ඔබේ අමුත්තන්ට ඒ පිළිබඳව යෝජනා / නිර්දේශ කළ හැකිය

5. නව බඳවා ගැනීම් අවස්ථා ඇති විටදී ඔබේ ප්‍රාදේශීය ප්‍රජාවේ පුද්ගලයන්ට ප්‍රමුඛත්වය දෙන්න

6. ඔබේ ප්‍රදේශය තුළ ඇති සංගම්වල ක්‍රියාකාරී සාමාජිකයෙක් වන්න. ඔබේ ප්‍රජාව තුළ ඇති සමාජ අභියෝග සඳහා තිරසාර විසඳුම් වෙනුවෙන් පෙනී සිටින්න







Booking.com විසින් කරන ලද සමීක්ෂණයකට අනුව සංචාරකයින්ගෙන් 66% ක් පමණ දේශීය සංස්කෘතිය පිළිබිඹු කරන අත්දැකීම් ලබා ගැනීමට ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි.

සංචාරක කර්මාන්තයේ සෑම රැකියාවක්ම ඔබේ යාබද ප්‍රජාවන් තුල අලුත් රැකියා අවස්ථා 1.63ක් ජනනය කරයි

2021 වසරේ සමීක්ෂණයකින් හෙළි වූයේ Booking.com ආයතනය සමඟ හවුල් වන නවාතැන් සපයන්නන්ගෙන් 66%ක්, තිරසාරත්වය, ප්‍රාදේශීය ප්‍රජාවන්ට ධනාත්මක බලපෑමක් ඇති කරන බව විශ්වාස කරන බවයි.